# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,883/5 — 1969 දෙසැම්බර් 21 වැනි ඉරිදා — 1969.12.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 29/56

### සුළු නගර සභා ආඥාපනත

### 183 වන වගන්තිය යටතේ වූ ආඥාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම, දළුගම සුළු නගර සභාවේ සභාපති රනවක ආරච්චිගේ සොලමන් පෙරේරා මහතා සම්බන්ධයෙන්—

(අ) සුළු නගර සභා ආඥාපනතින් පැවරී ඇති රාජකාරී කටයුතු ඉටු කිරීමෙහිලා විෂමාචාරයෙන් කටයුතු කිරීම ; හා

(ආ) එම ආඥාපනතින් පැවරී ඇති බලතල අයථා අන්දමින් පරිහරණය කිරීම,

යන මේවා ඔප්පු වන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට මා සෑහීමට පත්ව සිටින බැවින් එකී රනවක ආරච්චිගේ සොලමන් පෙරේරා මහතා එකී සුළු නගර සභාවේ සභාපති ධුරයෙන් මේ ආඥාවෙන් ඉවත් කරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1969 දෙසැම්බර් මස 21 දින,
කොළඹදී ය.

12-1056


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

1092/1—ජේ 9489—5,275 (69/12)